කවරෙකු අල්ලාහ්ට ආදේශ නොකර මිය ගියේ ද ඔහු ස්වර්ගයට පිවිසෙයි. කවරෙකු අල්ලාහ්ට යමක් ආදේශ කර මිය ගියේ ද ඔහු අපා ගින්නට පිවිිසෙයි" යැයි පැවසූහ

ජාබිර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. මිනිසෙකු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණ: "අහෝ අල්ලාහ්ගේ දූතයාණනි, අනිවාර්යය කරවන
කරුණු දෙක මොනවාදැ?"යි විමසා සිටියේය. එවිට එතුමාණෝ: "කවරෙකු අල්ලාහ්ට ආදේශ
නොකර මිය ගියේ ද ඔහු ස්වර්ගයට පිවිසෙයි. කවරෙකු අල්ලාහ්ට යමක් ආදේශ කර මිය ගියේ
ද ඔහු අපා ගින්නට පිවිිසෙයි" යැයි පැවසූහ. [صحيح] [رواه مسلم]

මිනිසෙක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගෙන් කරුණු දෙකක් පිළිබඳ විමසා සිටියේය: එනම් ස්වර්ගයට පිවිසීම අනිවාර්යය කරන දෑ හා අපා ගින්නට පිවිසීම අනිවාර්යය කරන දෑ ය. එයට සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ: ස්වර්ගය අනිවාර්යය කරන කරුණ වනුයේ මිනිසෙක් අල්ලාහ්ට කිසිවක් ආදේශ නොකර, ඔහුට පමණක් නැමදුම් කළ තත්ත්වයේ මිය යාමය. අපා ගින්න අනිවාර්යය කරවන කරුණ වනුයේ මිනිසෙක් අල්ලාහ්ට යමක් ආදේශ කර ඔහුගේ දේවත්වය හෝ පරිපාලනත්වය හෝ ඔහුගේ නාම හා ගුණාංගවල යම් සමානයක් හා ආදේශයක් නියම කිරීමය.

https://sunnah.global/hadeeth/si/show/65008